# ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාවේ මහඇදුරු සුදසුන

**දුල්මා කරුණාරත්න**

## The Brilliant Visionary of Sri Lankan Archaeology

**Dulma Karunarathna**

kdulma@yahoo.com

සුදර්ශන් සෙනෙවිරත්න මහාචාර්යතුමා පිළිබඳ මාගේ මතකයන් දශක දෙකකටත් වඩා අතීතයට දිවෙයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පළමු වසර සිසුන් වූ අපහට සුවිශේෂ දේශනයක් සඳහා පැමිණි එතුමා අප සැම එදින දුටුවේ සුදර්ශනයක් ලෙසිනි. ගම්භිර ආමන්ත්‍රණය සමගින් මැනවින් ගැළපුණු සාම්ප්‍රදායික පුරාවිද්‍යා අර්ථකථනයන්ගෙන් ඔබ්බට විකල්ප පුරාතත්ත්වයක් පිළිබඳ ව නව මානයන් අප හමුවේ ගෙනහැර පෑ ඔහු එදා පුරාවිද්‍යා විශේෂවේදී උපාධියක් වෙත බොහෝ සිසුන්ගේ අවධානය යොමු කරන ලදි.

අප විශේෂවේදී කණ්ඩායමට දස දෙනෙක් තෝරා ගනු ලැබුවේ තරගකාරී සම්මුඛ පරීක්ෂණයකිනි. පුරාවිද්‍යා කෞතුකාගාරයේ සිට තෝරා ගත් අප අමතා පළමුවරට එතුමා පැවසුවේ මෙම විෂයය අධ්‍යයනකිරීම සඳහා අප සතු විය යුතු මූලික ආකල්ප පද්ධතියකි. එනම් සතර අගතියෙන් තොර ව පුරා තත්ත්ව අර්ථකථනය කිරීමට අවැසි නිවහල් මානසික තත්ත්වයෙන් අප සන්නද්ධ විය යුතු බව යි. එය එතුමන් විසින් අපට දායාද කරන ලද මහඟු දැක්මේ මුල්ගල් තැබීම විය.

ANCIENT LANKA

*Ancient Lanka: Volume 4* (2025)
© 2025 by the author/s. https://doi.org/10.29173/anlk946
This is an open access article distributed under the terms and conditions of the Creative Commons Attribution CC BY 4.0

1999 වසරේ දී අප විශේෂවේදී පළමු වසර සිසුන් ලෙස අධ්‍යයන ගමන ආරම්භ කරද්දී වෙනත් විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා සිසුන් ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතුවල නිරත නොවුණු කාලයක් ය. නමුත් අපගේ මහාචාර්යතුමා පුරාවිද්‍යාව යනු ප්‍රායෝගික විෂයයක්ය යන කරුණ ඉතා ඉහළින්ම අගය කළ නිසා අපට පැවසුවේ අප දසදෙනා ම පොළොන්නරුව පුරාවිද්‍යා භූමියට කෙටි ක්ෂේත්‍ර අධ්‍යයනයක් සඳහා යා යුතු බව යි. අපගේ ආරක්ෂාව, ක්ෂේත්‍රයේ විවිධ තරාතිරම්වල අය සමග ගනුදෙනු කරන ආකාරය, එකිනෙකාට ගරුකරන අයුරු, ආදී විවිධ උපදෙස්වලින් එතුමා අප සන්නද්ධ කළේය. අපට නොකියා ම අප පොළොන්නරුවට එන බව ඒ වනවිටත් එහි කැණීම් කටයුත්තක් සඳහා ගොස් සිටි අපගේ ජ්‍යෝෂ්ඨ ශිෂ්‍යයන් දැනුවත් කර අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබුණි. මේ යන ගමනේ දී එතුමාගේ නමට සමාන නමක් පොළොන්නරුව රාජ සභා මණ්ඩපයේ ඇති බවත් එය සොයා ගන්නා ලෙසත් අපිට පැවසී ය. පොළොන්නරුවට පිවිසි අපහට නිශ්ශංක රාජ සභා මණ්ඩපයට ගොස් එය සොයා ගන්නා තුරු ඉවසිල්ලක් නොවී ය.

"සිංහාසනයේ වැඩහුන් කල සෙනෙවිරදුන් සඳහා ය" යන වැකිය සහිත සෙල් කුලුණ අසල එතුමා සදා නොමැකෙන මතකයක් අප ගේ හදවතේ රැඳවී ය. ගමනෙන් පසු අපගේ අත්දැකීම් ශාස්ත්‍රීය සටහනක් ලෙස එතුමාගේ පන්තියේ දී අප විසින් ඉදිරිපත් කරන ලදි.

එතුමන් විසින් අපට අතීත ඉන්දියාවේ සමාජ ආර්ථික ඉතිහාසය ඉගැන්වීමේ දී ඔහුගේ ඉන්දියාව පිළිබඳ හසළ අත්දැකීම් චිත්තරූප මවමින් අප ඉදිරියේ ගෙනහැරපාන ලදි. එනමුත් තවත් බොහෝ පුරාතත්ත්ව ක්ෂේත්‍රවලට නොගොස්, නොදැක අර්ථකථනය කළ නොහැකි නිසා ඒවා ඡායාරූප, වීඩියෝ මාර්ගයෙන් පෙන්වීමට ඔහු අපූරු උපක්‍රම යොදාගන්නා ලදි. අපේ කණ්ඩායමේ සියලු දෙනා ලැප්ටොප් පරිගණකයක් පළමුවරට දුටුවේ එදින ය. කුඩා පොතක් බඳු උපකරණයක් පෙරලා ඓතිහාසික ඡායාරූප අප ඉදිරියේ තබන ලදී. අතථ්‍ය චාරිකා (Virtual Tours) නම් පරිගණක ක්‍රමවේදය භාවිතයෙන් ඉන්දියාවේ හරප්පා නගරය පුරා ඇවිදයාමට අපිට ඉඩ හසර සැලසී ය. එය කිසි දිනක අමතක නොවන විස්මයජනක අත්දැකීමකි.

ඉන්දියා ඉතිහාසය ඉගැන්වීමේ දී එහි සුවිශේෂී පාඩම් පන්ති කාමරයෙන් පිටත වෙනත්ම ආකාරයේ ගවේෂණාත්මක සහ විවේචනාත්මක සාකච්ඡාවක් විය යුතු බව එතුමාගේ අදහස විය. දිනක පන්තියේ වාඩි වී සිටි අප සියලු දෙනා එතුමා විසින් පොළොන්නරුව නමින් හැඳින්වූ විශ්වවිද්‍යාල භූමියේ සෙල් කුලුනු පැතිර පැවැති භූමිය වෙත රැගෙන ගොස් අප කුඩා කණ්ඩායමක් ලෙස වාඩිවුණෙමු. විවිධ විචාරාත්මක ලිපිවලට අමතරව එතුමාගේ ප්‍රිය බිරිඳ හර්ෂා සෙනෙවිරත්න මහත්මිය විසින් එවන ලද රසවත් කේක් එකක් ද එතුමා අත විය. අප සියලු දෙනාටම කේක් කෑල්ලක් රසවිඳින්නට අවස්ථාවක් ලැබුණු අතර ම ඉන්දීය ඉතිහාසයේ විචාරයක් කියවූ එතුමා ඉන් අනතුරු ව විවිධ පුරාතත්ත්ව විචාරශීලී ව සිදුකරමින් අර්ථකථනය කරන අයුරු අපහට ඉගැන්වූයේ අපක්ෂපාතීත්වයෙන් සහ නිර්භය ව අතීතය ස්ථානගත කළ යුතු අයුරු පහදා දෙමිනි. පසුකාලීන ව එම විෂයය උගන්වන ගුරුවරිය ලෙස එතුමාගේ අඩිපාරේ යමින් මගේ සිසුදරුවන් සමඟින් එම පාඩම ඉගැන්වීමට සැමදා මා පොළොන්නරුවට ගිය විට මා

දරුවන්ට අපගේ මහාචාර්යතුමා ආරම්භ කළ මෙම එළිමහන් සංවාද මණ්ඩපය පිළිබඳ කෘතවේදීත්ව මතකයක් ද තැබීමට වගබලාගත්තේ අප ඉදිරියට ගෙන යන බොහෝ සාධනීය පියවරයන්හි නිර්මාතෘ අපගේ මහාචාර්යතුමන් වීම නිසාය.

සමාසික ක්‍රමය (Semester System) විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වාදීමට පෙර සිට අප පුරාවිද්‍යා විශේෂවේදී සියලු වසරවල දී අප මාස තුනක ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා ජේතවනාරාම භූමිය වෙතයැම අනිවාර්ය විය. සෑම සිකුරාදා දිනයක් ම වන තුරු අප බලා සිටින්නේ සතිය හමාර කිරීමට හෝ නිවසට යාමට නොවේ. ජේතවන භූමියේ අධ්‍යක්ෂතුමන් ලෙස අපගේ මහාචාර්යතුමන් එහි වැඩකටයුතු පරීක්ෂාව සඳහා පැමිණෙන තුරු ය. හවසට වැඩ ඇරී තම දරුවන් වෙත රස කැවිලි රැගෙන එන පියෙකු ලෙසින්ම ජේතවන සලපතළමළුව කෙළවරින් මතුවන්නේ මහාචාර්යතුමන් ය. අපගේ සියලු කටයුතු, අඩුපාඩු සොයා බලා අර්ථවත් සාකච්ඡාවක් ද පංචාවාස භූමියේ පැවත්වූ එම අධීක්ෂණ චාරිකා අප ව පුරාවිද්‍යා දැනුම් සමුදායකින් පුරවාලී ය.

අප තෙවන වසරේ පුරාවිද්‍යා සිසුන් ලෙස එවැනි කැණීමකට ජේතවනයට ගිය අවස්ථාවේ පංචාවාස භූමියේ (JSMP 2001) සිට විශේෂ සාකච්ඡාවක් පැවැත්වී ය. ඒ වන විට අප තවමත් තෙවන වසර සිසුන් ය. නමුත් එතුමා විසින් සාකච්ඡා කරන ලද්දේ අප සියලු දෙනාගේ අවසන් වසර නිබන්ධනය සඳහා තෝරාගත යුතු මාතෘකා සහ එම පර්යේෂණයන්ගේ උසස් පර්යේෂණාත්මක ගුණාත්මක ලක්ෂණ පිළිබඳ ව ය. එක සැණෙකින් ම මෙතෙක් අප ලත් පුරාවිදු පරිචය මගින් සිව්වන වසර මාතෘකාවක් සපයන ලෙස අපහට දැනුම් දෙන ලදි. එතුමන් විසින් අප තුළ ඇති කර තිබූ පුරාවිද්‍යා දැණුම සහ කුතුහලයන් පෙරදැරිව මම එතුමාගෙන් ඇසුවේ:

"සර්, අපිට ලංකාවෙන් පරිබාහිර ව වෙන රටක මාතෘකාවක් තෝරගන්න බැරි ද? මම කැමතියි ඉන්දියාවේ මාතෘකාවක් තෝරා ගන්න"

"මොකද බැරි, මම ඉතා ම කැමතියි මගේ දරුවන් අන්තර්ජාතික මට්ටමට යනවට"

දෙමාපියන්ගෙන් අවසර ගැනීමටත් පෙර පුරාවිද්‍යා අවසාන වසර නිබන්ධනය වෙනුවෙන් ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ කලා සම්ප්‍රදායේ වගතුග සහ එහි ලාංකේය ඥාතීත්වය සොයා යන්නට එම අනුමැතිය සහ දිරිදීම මට එදින ලැබී ය. මෙය එතුමාගේ ඉදිරිදැක්මේ (futuristic approach / forward thinking) පුරුද්දක් විය. ඉන් අනතුරු ව එතුමා එම නිබන්ධනයේ මාර්ගෝපදේශකයා ලෙස මා හට උපදෙස් දෙන හැම අවස්ථාවේ දී ම "ඔබ ඔබේ දර්ශනපති උපාධියේ දී සාකච්ඡා කළ යුත්තේ මේවා යි" ලෙස ඉන් ඔබ්බෙහි පවතින මගේ උපාධි පිළිබඳ ව දැක්මක් මා ඉදිරියේ සලකුණු කරන ලදි. අනතුරුව ඔහු මාගේ දර්ශනපති උපාධියේ මාර්ගෝපදේශකවරයා ලෙස සාකච්ඡා පවත්වන විට:

"ඔබගේ ආචාර්ය උපාධියේ දී ඔබගේ දැක්ම, ඉතිහාසය ප්‍රශ්න කිරීම, ගැටලු අභිමුඛ තත්ත්වයක ඉතිහාසය ස්ථානගත කිරීම, පුරාවිද්‍යා න්‍යාය ගොඩනැගීම, නව්‍ය ප්‍රවේශ සහ

විකල්ප පුරාතත්ත්ව සොයා යාම මෙලෙස විය යුතුයි" යයි ඔහු සාකච්ඡා කරන ලදි. එතුමන් සතු මෙම පෙරදැක්ම අප සිසුකැලවෙත දිගු ගමනක අත්වැල සටහන් කරනලදී.

පුරාවිද්‍යා ජීවිතයේ දී පුරාවිද්‍යාඥයෙකු සතු ව බහුවිධ කුසලතා පැවැතිය යුතු බව එතුමා තරයේ විශ්වාස කරන ලදි. අප සතු ව පැවති එවැනි කුසලතා ඔප්නංවාගැනීම සඳහා අප වෙත මහඟු වේදිකාවන් තැනවීම ද එතුමා අතින් සිදු විය. සෑම වසරක ම පුරාවිද්‍යා ප්‍රදර්ශනයක් පැවැත්වීම එහි විශේෂ අවස්ථාවකි. එය පුරාවිද්‍යා විශේෂවේදී සිසුන් පමණක් නොව සාමාන්‍යවේදී සිසුන්, උපාධි සම්පූර්ණ කළ ආදි විද්‍යාර්ථීන්ද සම්බන්ධකරන ලදි. දෙදහස වසරේ දී පැවති මතු පරපුර උදෙසා පුරාවිද්‍යාව (Archaeology for the Next Generation) නමැති ප්‍රදර්ශනය ශාස්ත්‍ර පීඨයේ ගල් කණු ප්‍රදේශ සිසාරා මහා ප්‍රදර්ශනයක් බවට පත්විය. එහි දී ඉතිහාසය ප්‍රශ්න කරමින් ඉතිහාසයේ නව මාන ඡායාරූප, පෝස්ටර් සහ අනුරූ ලෙස නිර්මාණය කරමින් ඒවා මහජනතාව වෙත ඉදිරිපත් කිරීම දක්වා අප හට පැවරුණු කාර්යය විය. එම ප්‍රදර්ශන සූදානම් කරන කාලයේ දී එතුමා විවිධ අවස්ථාවල පැමිණ අපගේ ප්‍රගතිය නිරීක්ෂණය, ඇගයීම සහ දිරිදීම කරන ලදී. එම ප්‍රදර්ශනය විවෘත වූයේ මහාචාර්ය රොමිලා තාපර් විසිනි. මා එහි දී ඉන්දුනිම්නයේ මව් දෙවඟන පිළිරුවක් සාදා කාන්තාවගේ ඉතිහාසය පිළිබඳ ව පෝස්ටරයක් නිර්මාණය කරන ලදි. තාපර් මහත්මිය එම නිර්මාණය පිළිබඳ මාගේ අර්ථකථනය කුමක්දැයි ඇසුවේ අනපේක්ෂිත අයුරිනි. මාගේ දැණුම පරිදි මගේ කුඩා තර්ක එතුමියට ඉදිරිපත් කරද්දී පසෙකින් සිට මහාචාර්යතුමා එතුමියට පවසන ලද්දේ ඇයගේ පශ්චාත් උපාධියේ දී ඒ පිළිබඳ අධ්‍යයනය කරනු ඇතැයි යනුවෙනි.



**1 රූපය** පරම්පරා ත්‍රිත්වයක බුද්ධිමය සංවාදය: මහාචාර්ය රොමිලා තාපර්, මහාචාර්ය සුදර්ශන් සෙනෙවිරත්න, දුල්මා කරුණාරත්න 2000 පුරාවිද්‍යා ප්‍රදර්ශනය

කාන්තාවගේ සමාජ පුරාවිද්‍යාව පිළිබඳ මාගේ පර්යේෂණ මූලබීජය එහි දී ම පැළපදියම් විය. එංගලන්තයේ මාගේ ආචාර්ය උපාධි වාචික පරීක්ෂණයේදී (2014) කාන්තාවගේ සමාජ පුරාවිද්‍යාව පිළිබඳ පර්යේෂණ ක්ෂේත්‍රයට අවතීර්ණ වූයේ කෙසේ ද යන්න මාගේ බාහිර පරීක්ෂකවරියගේ පළමු ප්‍රශ්නය විය. මා එහි දී අපගේ මහාචාර්යතුමා විසින් පැළ කරන ලද මෙම ශාස්ත්‍රීය බීජය පිළිබඳ ව මා අභිමානයෙන් පවසනලදි. ප්‍රදර්ශනය අවසානයේදී අප සියලු දෙනා ඇගයීමට ලක්කිරීම, අපගේ වර්ධනය විය යුතු පැති පෙන්වා දීම, ප්‍රගති සමාලෝචනයක් ද පවත්වන ලදී. එහි දී ගිටාරය වයමින් "ලෝඅඩ නින්දේ" ගීතය ගැඹුරු හඬින් ගායනා කළ අයුරු අනුස්මරණීය වේ. සෑම විශේෂ අවස්ථාවක සේ ම එතුමාගේ බිරිඳ  හර්ෂා මහත්මිය විසින් සාදන ලද ප්‍රණීත ආහාරපාන සංග්‍රහයකින් ප්‍රදර්ශනයේ සියලු වැඩ කටයුතු අවසන් වෙද්දී පුරාවිදු පවුලක් ලෙස මහා බැඳීමකින් අපි වටවී තිබෙනු අත්දකින ලදි.



**2 රූපය** 2006 පුරාවිද්‍යා ප්‍රදර්ශනය පූර්ව සූදානම සහ සාර්ථක අවසානයක මහඇදුරු සුගායනය

මීට දශක කීපයකට පෙර ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පුරාවිද්‍යා අධ්‍යයන අංශයන්හි උගන්වනු ලැබූයේ සාම්ප්‍රදායික විෂයය මාලාවකි (Classical Archaeology). නමුත් අපගේ මහාචාර්යතුමා හට පැවති පෙරදැක්ම (Forward thinking or futuristic approach) නිසා අනාගතයේ විවර වන පුරාවිද්‍යා මංපෙත් සේ ම ලංකාවට සහ අන්තර්ජාතික මට්ටමෙන් අප හට අවැසි දැණුමෙන් අප සන්නද්ධ කිරීම සඳහා එතුමා මහත් වෙහෙසක් දැරී ය. එහි දී අප අධ්‍යයනාංශයේ අධ්‍යයන කර්යමණ්ඩලය ඉතා සීමිතවූ බැවින් ලංකාව පුරා විසිර

පැවැති විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥයින් ආගන්තුක කථිකාචාර්යවරුන් ලෙස පේරාදෙණියට ගෙන්වීම සහ නව විෂයයන් හඳුන්වාදීම එතුමන් විසින් සිදුකරන ලදි. මා ඉගෙනුම ලැබූ වසරේ දී උරුම කළමනාකරණය නැමැති විෂයයක් පළමුවරට හඳුන්වා දී එය ඉගැන්වීම සඳහා  මහාචාර්ය බී. ඩී. නන්දදේව සහ රසායනික සංරක්ෂණය සහ කාලනීර්ණ පිළිබඳ ඉගැන්වීම සඳහා ආචාර්ය මොහාන් අබේරත්න කැඳවන ලදි. එසේ ම පෙරදිග භාෂාවන්ගේ වැදගත්කම තේරුම් ගෙන පාලි සංස්කෘත වැනි විෂයන් අපගේ විෂයය මාලාවට එක්වීමේ වැදගත්කම අගය කොට සැලකූ අයුරින් ම සංස්කෘතික මානව විද්‍යාව, කායව්‍යවච්ඡේද විද්‍යාවේ කොටස් භූගර්භ විද්‍යාව, භූගෝල විද්‍යාවේ සිතියම්කරණය, පරිගණක පුරාවිද්‍යාව සහ ප්‍රායෝගික පුරාවිද්‍යාව වැනි විෂයයන් සහ විෂයඒකකවලින් අපගේ උපාධිය සන්නද්ධ කරන ලදි. වසර හතරක් අවසානයේදි අප විශ්වවිද්‍යාලයෙන් සමත් වූ පුරාවිද්‍යා විද්‍යාර්ථීන් අන්තර්ජාතික මට්ටමේ ඉතා සවිමත් ව සිට ගැනීමට හැකි අය ලෙස බිහිවූයේ එතුමාගේ එම පෙර දැක්මේ සහ ඒවා ක්‍රියාවට නැංවීමේ නිර්භීතකම නිසාවෙන් ය.

එතුමන් විසින් අප ලංකාවෙන් එපිට මහා ලෝකයකට හඳුන්වා දෙනලදි. විදේශීය අත්දැකීම්වල දී මුණගැසුණු සුවිශේෂ පුද්ගලයින් දේශන සඳහා පේරාදෙණිය වෙත කැඳවාගෙන ඒම, ඒ අය සමග අපට කටයුතු කරන්නට ඉඩ හසර සැලසීම, පුරාවිද්‍යා ව්‍යාපෘති සකසා අප ඒවා වෙත සම්බන්ධ කිරීම සේම මාගේ පළමු උපාධි පර්යේෂණයට ඉන්දියාවට යාමේ දී එතුමා දැන හැඳුනුම්කම් පැවති මහාචාර්යවරුන් වෙත මා හඳුන්වාදීම, එහි දී ඒ අය මා වෙත දක්වන ලද කරුණාව, උදව් උපකාර, පොත-පත, දැණුම ගුරුවරයෙකුගේ වගකීම් පන්ති කාමරයෙන් ඔබ්බට පැවැති පුළුල් කාර්යභාරයක් බව එතුමා සෑමවිට ම ඔප්පු කරන ලදි. එවන් උදව්වක අවසන එතුමාට ස්තුතිය පළ කළ සෑමවිට ම පැවසූයේ,

"මම කළේ මගේ වගකීමයි ඔබ ඔබගේ ඉදිරිපරපුරට එම වගකීම ඉටුකරන්න" (pay it forward).

මෙවැනි උපකාර හුදෙක් තමන්ගේ සිසුන් වෙත පමණක් නොව පුරාවිද්‍යා කැණීම් භූමිවල කම්කරු මහතාගේ සිට සියලු තරාතිරම්වල අය වෙනුවෙන් ඔවුන්ගේ හෙටක් තැනීම වෙනුවෙන් නොමඳ උපදෙස් සහ උපකාර මේ මහා යුගපුරුෂයා අතින් ඉටුවෙනු අප දෑස් ඉදිරියේ දෘශ්‍යමාන විය. ඉගැන්වීම් කටයුතු අවසන්කොට නික්ම යන මොහොතේ ආපනශාලාවට පසෙකින් සිටින කුඩා සුනඛයෙකු දුටුවත් හිස අත ගා කෑමට යමක් ලබා දී සුරතල්කර කරුණාව ලබා දී යාමට තරම් මානුෂීය ගුණාංග එතුමාට තිබුණි. වරෙක අනතුරට ලක් වූ ඉතා කුඩා බලු පැටවෙකු පශු වෛද්‍ය පීඨයට ගෙන ගොස් සුවකොට නැවතත් එම බලු පැටවා වැඩී, මිය යන තෙක් ඉතා ආදරයෙන් තම නිවසේ ඇති දැඩි කරන ලද්දේ ඉතා උසස් කරුණා ගුණදම් ප්‍රකට කරමින් ය.

එතුමා බොහෝ විදේශ සංචාර කර, විදේශ විශ්වවිද්‍යාලවල උගන්වා, විශේෂ දෙසුම් පවත්වා තිබුණි. එතුමාගේ අභිලාෂය වූයේ තම දරු පරපුරයත් එම මහඟු අවස්ථා ළඟා කර

දීමටය. Ford Foundation සහ American Institute for Lankan Studies යන ආයතන විසින් එතුමා වෙත ඉන්දියාව සඳහා විශේෂ සංචාරක අවස්ථාවක් සූදානම් කර තිබුණි. ලංකාවේ බොහෝ විශ්වවිද්‍යාල මහාචාර්යවරුන් විදේශ ගමන් යන්නට රුචියෙන් පෙළගැසෙන මොහොතක එතුමා විසින් සිදු කරන ලද්දේ අප දෙපාර්තමේන්තුවේ ස්ථිර කථිකාචාර්ය, තාවකාලික කථිකාචාර්ය, සහ ජේතවන ව්‍යාපෘතියේ පර්යේෂණ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් මෙම කර්තව්‍යයට සම්බන්ධ කිරීම ය. එහි දී දෙරට අතර බෙදා හදාගත් සංස්කෘතික උරුමය සහ සංස්කෘතික විවිධත්වය පිළිබඳ විවිධ ප්‍රායෝගික වැඩසටහන් සහිත ගමනක අප නිරත වූ අතර ලංකාවේ සිට ඉන්දියාවට ගොස් සිටි සරණාගත දමිළ පිරිස් සමගද සාකච්ඡා පවත්වන ලදී. එවක ඉන්දියානු නියෝජ්‍ය මහකොමසාරිස්ව සිටි සුමිත් නාකන්දල මහතා සමග එක් ව උසස් වැඩසටහනක් ලෙස නිර්මාණය කරන ලද මෙම වැඩසටහන පුරාවිද්‍යා සාම තානාපතිවරුන් ලෙස උරුම පර්යේෂකයන්ගේ වගකීම, සාමය උදෙසා පුරාවිද්‍යා උරුමය භාවිතා කළ හැක්කේ කෙසේ ද යන්න ප්‍රායෝගික පුහුණුවක් ලබාදුන් අතර අපගේ පර්යේෂණ ක්ෂේත්‍රයන් සඳහා විවිධ මංපෙත් විවිධ ආයතනික සම්බන්ධතා ඔස්සේ විවර කර දෙන ලදි. ඉන්දියානු පුරාවිද්‍යා සේවයේ මහා පතාක යෝධයන් බඳු නාගරාජ රාවෝ වැනි අය මුණගැසීම, ඉතා සුවිශේෂ කැණීම් ස්ථානයන් වන කොඩුමනල්, අරිකමේඩු, අදිච්චනල්ලූර් වැනි පුරාවස්තු සියැසින් දැක බලා අත්දැකීම් ලබාගන්නට එතුමාගේ මේ ව්‍යායාමය අප හට අවස්ථාව ලබා දෙන ලදි.



**3 රූපය** ඉන්දියානු චාරිකාව පිටත්වයාමට පෙර මහනුවර ඉන්දියානු නියෝජ්‍ය මහකොමසාරිස් කාර්යාලයේදී - 2005

ඉතා සාර්ථක ගමනක් යන්නට සහ අභියෝග ජයගන්නට එතුමන් අප සැම විටම පුරුදු පුහුණු කරන ලදි. මා තාවකාලික කථිකාචාර්යවරියක් ලෙස පැමිණි ගමනේ දී එතුමා තමා විසින් උගන්වන ලද ඉන්දියාවේ සමාජ ආර්ථික ඉතිහාසය විෂයයේ සහායක ගුරුවරියක් ලෙස පැමිණෙන ලෙස මා හට පැවසී ය. එතුමන් දේශන පවත්වද්දී එතුමාගේ දේශනවලට

සිසුන් සමග මා ද සහභාගී විය. සිසුන් සමග අතිරේක සාකච්ඡා මා විසින් පවත්වන ලදි. දිනෙක ප්‍රධාන දේශනයට මිනිත්තු පහක් පැවතිය දී එතුමන් පැමිණීමට ප්‍රමාද වන බවත් මා හට එදින දේශනය පවත්වන ලෙසත් දූරකථනයෙන් දැනුම් දෙන ලදි. මා සුපුරුදු පරිදි පන්තියේ ඉදිරියට පැමිණ දේශනය අරඹන ලදි. රූප සටහන් අඳිමින් සිසුන් වෙත මාගේ දේශනය පවත්වමින් සිටිය දී පමා නොවී එතුමා ද දේශනය ශාලාවට පැමිණ ඉදිරිපස අසුනක අසුන් ගන්නා ලදි. මා කතා කරමින් සිටි වාක්‍ය කීපය අවසන්කර දේශනය ඉදිරියට කරගෙන යාම සඳහා එතුමාට ආරාධනා කරන ලදි.

"මමත් අද ඔබගේ ශිෂ්‍යයෙක්, ඔබ දේශනය දිගට ම පවත්වාගෙන යන්න."

ඉන්දියානු ඉතිහාසය පිළිබඳ මහා දැවැන්තයෙකු ඉදිරිපස තබාගෙන ඉන්දීය ඉතිහාසය විශ්වවිද්‍යාල සිසුන්ට ඉගැන්වීම කෙතරම් අභියෝගයක්ද. මාගේ මනස වටහා ගත්තා සේ එතුමන් පැවසූවේ:

"මගේ ශිෂ්‍යයෝ හැමදා ම අභියෝග හොඳින් ජය ගත්තා" යනුවෙනි.

එය මා දිරිමත් කළා සේ ම ඉතා සාර්ථක ලෙස කළ දේශනය අවසානයේ දී එතුමා මා වෙත පැමිණ

"මගේ ගුරුතුමිය රොමිලා තාපර් මේ විදිහට තමයි මාව පුරුදු පුහුණු කළේ. මට ඔබ ගැන ආඩම්බරයි."

යනුවෙන් පවසා මා දිරිගැන්වී ය. මේ අයුරින් ම උපාධි අපේක්ෂක සිසුන් සියලුදෙනා ස්වකීය අවසන් වසර නිබන්ධනය තම දෙපාර්තමේන්තු ආචාර්ය මණ්ඩලය හමුවේ ඉදිරිපත් කිරීමෙන් ද තම සිසුන්ට අභියෝග ජයගනීමට අවැසි ශක්තිය ලබාදුණි. වර්තමානයේ පර්යේෂණ සැසි ලෙස මෙය සෑම දෙපාර්තමේන්තුවක ම අනිවාර්ය ක්‍රියාකාරකමක් වුව ද අප මහාචාර්යතුමා මෙම සම්ප්‍රදාය ආරම්භ කරනු ලැබුයේ මීට දශක කිහිපයකට පෙර ය.

විදේශීය කණ්ඩායම් සමග ව්‍යාපෘති අරඹා එම පුරාවිද්‍යා කැණීම් සඳහා අපගේ ශිෂ්‍ය කණ්ඩායම් යැවීම තුළින් අන්තර්ජාතික මට්ටමෙන් පුහුණු වූ පුරාවිද්‍යාඥයින් සෑම විට ම නිර්මාණය කිරීම එතුමාගේ අභිප්‍රාය විය. ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට අප උනන්දු කළ අතර විටෙක දේශනයේ කොටස් ඉංග්‍රීසියෙන් පැවැත්වීම, ඉංග්‍රීසි ලිපි ලේඛනවල පිටපත් කුඩා පුස්තකාලයක් ලෙස සකසා දෙපාර්තමේන්තුවේ වෙන ම ඉඩ-කඩක අපට කියවීම් කාමරයක් ලෙස සැකසීම (student documentation room), අපගේ දැණුම් පුළුල් කිරීම සඳහා කළ දෑ ය. පුරාවිද්‍යා විද්‍යාගාරය පිහිටුවා ප්‍රායෝගික පුරාවිද්‍යා සැලසුම් නිර්මාණය වැනි විශේෂ කර්තව්‍යයන් සිදු කිරීමට විශේෂ නිර්මාණ ශිල්පියෙකු සේවයට යොදවා අපගේ පුරාවිද්‍යා වාර්තාකරණ දැණුම ඉහළට ඔසවා තබන ලදි.

එතුමා ගුරුවරුවෙක් ලෙස තම සිසු පරපුර බලාගැනීම පන්ති කාමරයෙන් ඔබ්බට ද ක්‍රියාත්මක විය. වසර හතරක අවසානයෙන් පසු නික්ම ගිය පුරාවිද්‍යා සිසුන්ට ද විවිධ රැකියාවල නිරත සිසු සිසුවියන්ට ද අනාගත අවශ්‍යතා සොයා බලා රැකියා හා මාර්ග,

ශිෂ්‍යත්ව සහ විදේශීය අධ්‍යාපන ප්‍රවේශයන්, පශ්චාත් උපාධි ආදියට මඟ පෙන්වා ඒ සඳහා නිර්දේශ කිරීමේ වාර්තා (Reference Reports) ලබා දෙමින් දෙමාපියන් විසින් දරුවන් රැකබලා ගන්නා සේ යහපත් ගුරුසිසු සබඳතාවක සලකුණු තැබී ය. සෑම කෙනෙක් වෙනුවෙන් ම එතුමාගේ කාර්යබහුල භාරදූර ජීවිතය තුළ ඉඩකඩක් වෙන් විය. ඉතා ඉහළ තනතුරු දරන අවස්ථාවන්වල දී පවා පුංචි අය වෙනුවෙන් වචනයක් කතා කිරීමට, සාකච්ඡා පැවැත්වීමට එතුමා ඉඩහසර වෙන් කරන ලදි. එතුමා අප සියලු දෙනා අමතා අපගේ සුව දුක් අධ්‍යාපන පර්යේෂණ ප්‍රගති සොයා බැලීමට අමතක නොකරන ලද්දේ ය.

වරින් වර ඇමරිකාවේ විදේශීය ආයතනවල ඉගැන්වීමට ගොස් නැවත පැමිණීමේ දී පොත්පත් ලිපි ලේඛන විශාල ප්‍රමාණයක් රැගෙනවිත් අප දෙපාර්තමේන්තුවේ ඒ ඒ විෂයය කරන ගුරුවරුන් වෙත එම පොත් ලබා දෙන ලදි. එතුමාගේ පුස්තකාලයේ අප සැමගේ ඉගැන්වීමේ සහ පර්යේෂණ සඳහා අදාළ පොත්පත් ලිපි ලේඛන වේ නම් ඒවා ඉතා ත්‍යාගශීලී ලෙස අප අතර බෙදා දෙන ලදි. විදේශ ගමන් සිට ලංකාවට පැමිණෙන විට පියෙක් තම දරුවන්ට තෑගි රැගෙන එන්නා සේ විවිධ විදේශීය කැවිලි වර්ග අපට පමණක් නොව සේවක මණ්ඩලයට, අනධ්‍යයන නිලධාරීන්ට පවා ඒවායින් සංග්‍රහ කිරීමට තරම් ඔහු ත්‍යාගශීලී විය. මහා ශරීරයක් සහ මහා පෞරුෂයක් තුළ ඉතා නිහතමානී මානව දයාවෙන් පිරි මිනිසෙකු ඔහු තුළ විය. ඉතා සරල දිවියක් ගත කළ ඔහු හෙට දවස වෙත තබා යන්නේ උපමාවට ගතයුතු පුරාවිදු සලකුණකි.

සාම්ප්‍රදායික පුරාවිද්‍යා අර්ථකථනයෙන් ඔබ්බට යා යුතු බව එතුමාගේ නිබඳ සාකච්ඡාව විය. පන්ති කාමරයෙන් ඔබ්බට පුරාවිද්‍යා ක්ෂේත්‍රවලදී පවා එවැනි අලුත් පුරාතත්ත්ව පිළිබඳ සාකච්ඡා පවත්වන ලදි. වෙස්සගිරිය කැණීම පවත්වන අවස්ථාවේ දී නිතර විශේෂ සාකච්ඡා පැවැත්වූ අතර වෙස්සගිරියේ එක් සුවිශේෂී පර්වතයක් ආසන්නයේ ඒ ගල් තලාව පර්යේෂණ සාකච්ඡා සඳහා ම වෙන් කොට එය බුද්ධි පබ්බත යනුවෙන් ව්‍යවහාර කරමින් පුරාවිද්‍යා විද්‍යාර්ථයින්ගේ දැණුම සහ සාකච්ඡා මානයන් පුළුල් කරවන ලදී.



**4 රූපය** වෙස්සගිරිය බුද්ධි පබ්බත

එහිදී එතුමා වෙස්සගිරිය සහ වෙනත් ඉතිහාස තත්ත්ව කෙලෙස විශ්ලේෂණය කළ හැකි ද යන මැයෙන් පර්යේෂණ ලිපිලේඛන පුරාවිද්‍යා කථිකාවට එකතු කරන ලදි. සැම විට ම එතුමා විසින් පවසන ලද්දේ ඉතා ඉක්මනින් තරගයකට හෝ උසස්වීමක් උදෙසා ලේඛන සමුදායක් ලියනවාට වඩා ශාස්ත්‍රීය, සාරගර්භ, ඉතිහාසය ප්‍රශ්න කරන නව අර්ථකථන රැගත් පුරාවිද්‍යා පර්යේෂණ ලිපි සැකසීම සහ එම සාකච්ඡාව මතු පරපුර වෙත රැගෙන යාමේ වැදගත් බව යි. එතුමා විසින් ලියන ලද සුවිසල් සාරගර්භ පර්යේෂණ ලිපි මේ සඳහා සාක්ෂි දරයි. අදින් වසර තිහකට පෙර 1995 දී සේරුවිල යපස් නිධිය පිළිබඳ විද්‍යාත්මක විශ්ලේෂණ සිදුකොට, ඓතිහාසික දත්ත සහ පුරාවිද්‍යා දත්ත සමඟ සංසන්දනය කරමින් ඓතිහාසික යුගයේ සම්පත් හැසිරවූ පුද්ගලයින්, නායකයින් සහ එම සම්පත් හා සම්බන්ධ වූ පරිවහන රටා, භූවමාරු ජාලය ලෝකය හමුවේ ගෙනහැර පාන ලදි (The Ecology and Archaeology of the Seruwila Copper-Magnetite Prospect Northeast Sri Lanka).

මෙම විද්‍යාත්මක විශ්ලේෂණ ලොව පුරා පර්යේෂකයින් අදට ද භාවිත කරයි. නමුත් අවාසනාවකට මෙන් පසු පර්යේෂකයින් සහ ලංකාවේ දේශපාලකයින් අදටත් අපේ පුරාවිද්‍යා අභිමානය ගැන පවසනවා විනා තිරසර උරුමය උදෙසා මෙම සම්පත් කෙලෙසින් පවත්වා ගත යුතු ද මේවායින් අප කෙලෙස ප්‍රයෝජන ගත යුතු ද යන්න නොසලකා හැරීම අභාග්‍යයට කරුණකි. එතුමා විසින් සොයා ගත් නව දත්ත, උපකල්පන සහ න්‍යාය, ඉතා නිර්ලෝභී ව සහ ත්‍යාගශීලී ලෙස තම සිසුන් අභිමුව සාකච්ඡා කරන ලදි. එතුමාගේ අප්‍රකාශිත පර්යේෂණ තොරතුරු, දැණුම තම සිසුන් සමග බෙදා හදා ගන්නා ලදී. සමහර තොරතුරු එතුමා කිසි දිනක පළ නොකළ අතර සිය ගණනක් එතුමන්ගේ සිසුන් විසින් එතුමා සාකච්ඡා කළ තොරතුරු ලිපි සහ පොත් ලෙස එළි දක්වා ඇත. එතුමාගෙන් බුද්ධිමය ආලෝකය ලබා පර්යේෂණ නිලධාරීන්ගේ සිට ඉතා ඉහළ පුරාවිද්‍යා නිලධාරීන්, විශ්වවිද්‍යාල ආචාර්ය මහාචාර්යවරුන්, අන්තර්ජාතික පර්යේෂකවරුන් දක්වා පිරිසක් බිහි කර ඇත. දශක ගණනක ඇවෑමෙන් එම ශාස්ත්‍රීය පෝෂණය උකහාගත් පර්යේෂකයන් කීදෙනෙකුට එතුමා විසින් කළ මෙහෙවර මතකදැයි මම නොදනිමි. නමුත් මේ සොබාදහම එතුමා තම දරුවන් වෙත නිර්ලෝභී ව දායාද කළ නිවහල් චින්තනය සහ දැණුම දැත දිගු කළ මනුෂ්‍යත්වය ස්මරණීය සටහන් ලෙස තබා ගනු ඇත. සෙල්ලිපියක් සේ තවත් වසර දහස් ගණනක් යනතුරු ඒ පුරාවත විශ්වයේ පවතිනු ඇත. පුරාවිදූ ජීවිතය තුළ අපලත් වටිනා ම සොයාගැනීම ඇදුරුතුමණි ඔබයි.

ශ්‍රී ලාංකේය පුරාවිදූ කෙතේ පහළ වූ ඉතා දුලබ පුරාවෘත්තයක් බඳු එතුමා නික්ම ගොස් හමාර ය. එහෙත් තවත් වසර සිය ගණනක් එතුමා තබා ගිය ශාස්ත්‍රීය සටහන් අපගේ නැණ නුවණ බබළවනු ඇත. එතුමා දුටු අනාගතය, එම අනාගත අවශ්‍යතා, පුරාවිද්‍යා මං පෙත් විවරවනු ඇත. බොහෝ දෙනා ජනප්‍රිය මාවත් ඔස්සේ යමින් සාම්ප්‍රදායික පුරාවිද්‍යා මුවහමට තඩිබාන්නා සේ පර්යේෂණන එළිදක්වද්දී විකල්ප පුරාතත්ත්ව ගැන කතා කළ මේ මහා යුගපුරුෂයා උරුමය සාමය සහ ගැටුම් නිරාකරණය සඳහා භාවිතා කරන ආකාරය එසේ ම උරුමය තිරසර සංවර්ධනය වෙනුවෙන් භාවිත කරන ආකාරය පිළිබඳ ව, උරුම

පර්යේෂකයාගේ කාර්යභාරය, ආකල්පමය වෙනසක් සහ සුසමාදර්ශ උදෙසා මහා දායාද රැසක් තබා ගොස් ඇත. එම යුගපුරුෂයාගේ යුග මෙහෙවර අප නිසි ලෙස අගය කරන්නේ නම් එතුමා තබා ගිය එම දැණුම අප විසින් මනා ලෙස උපයෝගී කරගත යුතු ය. මීට වසරකට පෙර, එනම් 2024 දී එතුමා දිවිසැරිය නිම කරන ලදි. අප මුල් වරට එතුමාගේ නම අසන විට එය ඉතා හුරුපුරුදු නමක් විය. සුදසුන් යන්න පුරාවිද්‍ය සෙල්ලිපිවල සටහන් විය. එහි අර්ථය මනා වූ දර්ශනය යන්නයි. එතුමා එම නාමය දැරීමට අත්‍යන්තයෙන් යෝග්‍ය විය. ආරෝහ පරිණාහ දේහයෙන් යුතු සිනහවෙන් මුවග පුරවාගත් ඒ මානව හිතවාදී මහාපුරුෂයා මහා සුදර්ශනයක් ම ය. එසේ ම දේශීය, විදේශීය පුරාවිද්‍ය ඥානය කලඹමින් එම පුරාවිද්‍ය උරුමය ලෝකයට සහ මතු පරපුරට ගෙන යාමට එතුමා සතු වූ දැක්ම හෙවත් දර්ශනය සුදර්ශනයක් ම ය.